**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 14/91 (VI)**

මගේ අංකය :- 111/140එල්100ටී/39/11
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993 ජනවාරි මස 15 වෙනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන් සහ
රාජ්‍ය සංස්ථා, හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් වෙත.

<u>**සහනදායක කොන්දේසි මත වාහන ආනයනය කිරීම**</u>

1991 මැයි මස 08 වෙනි දින අංක. 14/91 හා 1991.10.04 දිනැති අංක 14/91 (1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට ඔබේ අවධානය යොමු කරවමි.

02. 1991.10.04 දිනැතිව නිකුත් කරන ලද අංක. 14/91 (1) දරණ චක්‍රලේඛණයේ 2-(2) ජේදයට අනතුරුව පහත සඳහන් ජේදය එකතු කිරීමෙන් එම චක්‍රලේඛණය සංශෝධනය කරනු ලැබේ.

> “(2) (අ)කෙසේ වෙතත් යම්කිසි නිලධාරියෙකුට රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් වාහනයක් මිළදී ගෙන අවුරුදු තුනක් (3) ක් ගත වූ පසු එම වාහනය පාවිච්චියට සුදුසු නැති බවට ද, ගර්හිත බවට ද, ඔහුගේ නමට ඇති ලියාපදිංචිය අවලංගු කර ඇති බවට ද, සහතිකයක් මෝටර් වාහන පිළිබඳ කොමසාරිස්ගෙන් ලබා ගෙන අදාල බලධාරීන්ට ඉදිරිපත් කිරීමට හැකිනම් එවැනි නිලධාරියෙකුට සහනදායක කොන්දේසි මත වාහනයක් ආනයනය කිරීමට ඉඩදිය හැක.“

03. මෙම චක්‍රලේඛණය භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලද්දක් බව කරුණාවෙන් සලකන්න.

අ/කලේ: එම්.එන්. ජුනයිඩ්
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය